VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 Police Park Place, Colombo 05, Sri Lanka
Tel: + 94 112055544; Fax: +94 719379567
Email: reception@veriteresearch.org

# 2014 මානව හිමිකම් කවුන්සිල යෝජනාවලිය හා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවට පක්ෂ හා විපක්ෂ ඡන්දය ප්‍රකාශ කළ රටවල් සමග පවත්වන ජාත්‍යන්තර සබඳතා පිළිබඳව විශ්ලේෂණය කිරීමේදී වැදගත් කරුණු කිහිපයක් අනාවරණය කර ගැනීමට හැකි විය. විශේෂයෙන්ම 2012 හා 2013 යන වර්ෂ 2 තුළ ඡන්දය ප්‍රකාශ කළ ආකාරය දෙස බැලීමේදී පෙනී යන්නේ ශ්‍රී ලංකාව හා ශක්තිමත් වෙළඳ සම්බන්ධතාවයක් පවත්වන රටවල් මානව හිමිකම් කවුන්සිලය විසින් ඉදිරිපත් කළ යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කර ඇති බවත් යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ හා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි රටවල් ශ්‍රී ලංකාව සමග එතරම් ශක්තිමත් වෙළඳ සබඳතාවයන් නොපවත්වන බවත්ය.

**2012 හා 2013 මානව හිමිකම් කවුන්සිලය**

2012 හා 2103 මානව හිමිකම් කවුන්සිලය නියෝජනය කළ රටවල් සමග ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයන වල වෙළඳ දිශානතිය දෙසට අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ අපනයන වලින් 80% ක් හා ආනයන වලින් 60% ක් පමණ ඉහළ ප්‍රතිශතයක් මානව හිමිකම් කවුන්සිලයේදී ඉදිරිපත් කළ යෝජනාවට පක්ෂව ඡන්දය ඡන්දය ප්‍රකාශ කළ රටවල් මත රඳා පවතින බවයි. මින් ගම්‍ය වන අර්ථය නම් යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සහ ඡන්දය දීමෙන් වැළකී සිටි රටවල් ශ්‍රී ලංකාවේ ආනයන (40%) හා අපනයන (20%) තුළ එතරම් ප්‍රබල දායකත්වයක් පෙන්නුම් නොකරන බවයි.

මෙම විශ්ලේෂණය මගින් අනාවරණය වන දෙවැනි කරුණ වන්නේ මානව හිමිකම් කවුන්සිලය විසින් ඉදිරිපත් කළ යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ ප්‍රකාශ කළ රටවල් සමග ශ්‍රී ලංකා ජාත්‍යන්තර වෙළඳාම තුළ ඉහළ ප්‍රතිලාභ භුක්ති විඳින බවයි. ජාත්‍යන්තර වෙළඳාමේ ප්‍රතිලාභ පිළිබඳ අදහසක් ගෙනදෙන ප්‍රධාන මිනුම් දණ්ඩ වන්නේ වෙළඳ ශේෂයයි. යම්කිසි රටක් සමග සිදුකරන ද්විපාර්ශවික වෙළඳ ගනුදෙනුවකදී අපනයන වටිනාකම ආනයන වටිනාකම ඉක්මවා යන්නේ නම් එහිදී ධන වෙළඳ ශේෂයන් නිර්මාණයවී වෙළඳ ප්‍රතිලාභ ජනනය කෙරේ. යම්හෙයකින් ආනයන වටිනාකම අපනයන වටිනාකම ඉක්මවා යන්නේ නම් එහිදී ඍණ වෙළඳ ශේෂයක් නිර්මාණය වේ.

2012 හා 2103 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී ඉදිරිපත් කළ යෝජනාවන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ රටවල් සමල ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂය ධන අගයක් ගත් අතර යෝජනාවට විපක්ෂව සහ ඡන්දය දීමෙන් වැළකී සිටි රටවල් සමග ගනුදෙනු වලදී වෙළඳ ශේෂය ඍණ අගයක් ගන්නා ලදී. (මෙහිදී ඉන්දියාව හැර අනෙකුත් රටවල් පමණක් සැලකිල්ලට ගෙන ඇත. ඊට බලපෑ හේතුව නම් ඉන්දියාව සමග ඉතා ඉහළ ඍණ වෙළඳ ශේෂයක් පැවතීමයි.)

**2014 මානව හිමිකම් කවුන්සිලය**

2014 මාර්තු මාසයේ ඉදිරිපත් කරන ලද මානව හිමිකම් කවුන්සලයේ යෝජනාව සම්බන්ධව ද ඉහත විශ්ලේෂණය සිදුකිරීමේදී පෙනී යන්නේ 2012-13 ට සාපේක්ෂව එය තරමක සියුම් වූ වෙනස් ස්වරූපයක් ගන්නා බවයි. එනම් ඡන්දය දුන් රටාව තුළ ශ්‍රී ලංකාව අනෙකුත් රටවල් සමග පවත්වා ගත් වෙළඳ සබඳතා වල ශක්තිමත්භාවයට (වෙළඳ ශේෂය මත පදනම් වූ) වඩා වෙළඳ දිශානතිය වැදගත් වූ බවයි. මෙහිදී ශ්‍රී ලංකාවේ අපනයන දිශානතිය තුළ ප්‍රමුඛස්ථානයක් ගන්නා රටවල් යෝජනාවට පක්ෂව ද, ආනයන දිශානතිය තුළ ප්‍රමුඛස්ථානයක් ගන්නා රටවල් යෝජනාවට විපක්ෂව හෝ ඡන්දය දීමෙන් වැළකී සිටි ආකාරයක්ද දක්නට ලැබුණි.

2012 හා 2013 යන වර්ෂවල ඡන්දය ප්‍රකාශ කළ ආකාරයේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයක් වන්නේ සියළුම රටවල් එම යෝජනාව කෙරෙහි 2012 දී සිදුකරන ලද වරණය ම 2013 දීද සිදුකිරීමයි. උදාහරණයක් ලෙස යම් රටක් 2012 ද යෝජනාවට පක්ෂප ඡන්දය පල කළේ නම් 2013 දී යෝජනාවට පක්ෂව සිය වරණය ප්‍රකාශ කළ බවයි. යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමේදී හා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමේදී ද මෙම රටාව දක්නට ලැබුණි. නමුත් 2014 දී රටවල් 6ක් 2012 හා 2013 ට සාපේක්ෂව සිය වරණයන් වල වෙනස්කමක් සිදුකරන ලදී. ඒ පිළිබඳ තොරතුරු සංක්ෂිප්තයක් පහත වගුව මගින් දක්වා ඇත.

***2012 හා 2013 ට සාපේක්ෂව 2014 දී සිය වරණය වෙනස් කළ රටවල්***


| රට | 2012 හා 2013 වරණය | 2014 වරණය |
|---|---|---|
| ඉන්දියාව | යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී | ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටින ලදී |
| බොට්ස්වානා | ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී | යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී |
| පිලිපීනය, ඉන්දුනීසියාව හා කුවේට් රාජ්‍යය | යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී | ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටින ලදී |
| කෙන්යාව | ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටින ලදී | යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී |

ශ්‍රී ලංකාවේ අපනයන දිශානතිය තුළ ප්‍රමුඛස්ථානයක් ගන්නා රටවල් බොහෝමයක් 2014 දී එක්සත් ජාතීන්ගේ මානව හිකම් කවුන්සිලය විසින් ගෙන ආ යෝජනාවට පක්ෂව සිය ඡන්දය පල කරන ලදී. මෙම රටවල් වලට සිදුකරන අපනයන ශ්‍රී ලංකාවේ මුළු අපනයන වටිනාකමින් 74% ක් වැනි ඉතා ඉහළ අගයක් ගනී. ඒ අනුව යෝජනාවට විපක්ෂව හා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි

රටවල් වලට සිදුකරන සමස්ත අපනයන වල වටිනාකම 26% ක් වැනි කුඩා අගයක් ගන්නා ලදී (ශ්‍රී ලංකාව ඉන්දයාවට සිදුකරන අපනයන වල වටිනාකම 2013 දී මුළු වටිනාකමින් 8% ක් විය).

2014 මානව හිමිකම් කවුන්සිලයේදී ඉදිරිපත් වූ යෝජනාවට විපක්‍ෂව හා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි රටවල් 2013 ශ්‍රී ලංකාවේ ආනයන දිශානතිය තුළ ප්‍රමුඛස්ථානයක් ගන්නා ලදී. මෙම රටවලින් ශ්‍රී ලංකාව සිදුකරන ආනයන ශ්‍රී ලංකාවේ මුළු ආනයන වටිනාකමින් 83% ක් වැනි ඉතා ඉහළ අගයක් ගන්නා ලදී (මින් 27% ක ප්‍රතිශතයක් ඉන්දියානු ආනයන වේ). ඒ අනුව යෝජනාවට පක්‍ෂව ඡන්දය ප්‍රකාශ කළ රටවල සමස්ත ආනයන ප්‍රතිශතය 17% ක් වැනි සුළු අගයක් ගන්නා ලදී.

රූප සටහන 01 ඃ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය නියෝජනය කළ රටවල් සමග ශ්‍රී ලංකාවේ වෙළඳ සබඳතා වල ස්වභාවය





මූලාශ්‍රය ඃ ශ්‍රී ලංකා රේගුව - 2012/2013 වෙළඳ දත්ත

ධන වෙළඳ ශෙෂයක් පැවතීම ආර්ථිකයකට ප්‍රතිලාභදායි වේ. එමනිසා අපනයන හා ආනයන වටිනාකමට අමතරව යෝජනාවට පක්‍ෂව හා විපක්‍ෂව ඡන්දය ප්‍රකාශ කළ රටවල් සමග ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂයෙහි ස්වභාවයද පිරික්සා බැලීම වැදගත් වේ.

2014 මානව හිමිකම් කවුන්සිල සැසිවාරයේදී ඉද්රිපත් වූ යෝජනාවට පක්‍ෂව ඡන්දය ප්‍රකාශ කළ රටවල් සමග ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් බිලියන 3.2 ක පමණ ඉහළ ඉහළ ධන වෙළඳ ශේෂයක් පවතී. 2013 කවුන්සිල සැසිවාරයේදී මෙම අගය ඇ.ඩො. බිලියන 2ක් පමණ විය. එමෙන්ම

එහිදී යෝජනාවට විපක්‍ෂව හා ඡන්දය දීමෙන් වැළකී සිටි රටවල් සමග ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂය ඇ.ඩො. බිලියන 5.1 ක් වැනි ඉතා ඉහළ අගයක් ගන්නා ලදී. (2013 දී ඇ.ඩො. බිලියන 2.6 ක් විය). 2014 දී ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි, ශ්‍රී ලංකාව සමග ඇ.ඩො. බිලියන 2.6 ක් වැනි ඉතා ඉහළ ඍණ වෙළඳ ශේෂයක් පවතින ඉන්දියාව මෙහිදී අන්තර්ගත කොට නොමැත. ඒ අනුව පෙනී යන්නේ මෙම යෝජනාව සඳහා පක්‍ෂව ඡන්දය ප්‍රකාශ කළ රටවල් ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ගෙනදෙන පාර්ශවකරුවන් බවයි.

රූප සටහන 02 : ඡන්දය ප්‍රකාශ කළ ආකාරය අනුව අපනයන හා ආනයන වටිනාකම (ඉන්දියාව හැර)




මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව - 2012/2013 වෙළඳ දත්ත

**ගම්‍ය වීම්**

2013 දී ශ්‍රී ලංකාවේ අපනයන වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දක්වූ විට 16% ක පමණ විය. එමෙන්ම ගුණක ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයක් තුළ ඉහළ ප්‍රතිලාභ ජනනය කිරීමේ ශක්‍යතාවයක් අපනයනය තුළ පවතී. 2014 මානව හිමිකම් කවුන්සිල් සැසිවාරය නියෝජනය කළ රටවල් වලට ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන වලින් 70% ක් පමණ සිදුකරනු ලබයි. එමෙන්ම යෝජනාවට පක්‍ෂව ඡන්දය ප්‍රකාශ කළ රටවල් වලට සිදුකරන අපනයන වටිනාකම සමස්ත අපනයන වලින් 52% ක් පමණ විය.

මේ අනුව පෙනී යන්නේ 2014 මානව හිමිකම් කවුන්සල සැසිවාරයේදී ඉදිරිපත් කළ යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ රටවල් සැබෑ ලෙසම ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයෙහි ස්ථාවරභාවය රැකගැනීමට විශාල රුකුලක් දෙන බවයි. එමනිසා මෙම රටවල් සමග මනා සංහිඳියාවක් පවත්වා ගැනීම තුළින් ශ්‍රී ලංකාවට ළඟා කරගත හැකි ප්‍රතිලාභ ඉතා ඉහළය.

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**

**ඔබගේ අදහස් insights@veriteresearch.org වෙත විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.**